උද්භිද උද්‍යාන භාර අරමුදල - 2020
------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන
----------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

උද්භිද උද්‍යාන භාර අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1996 දෙසැම්බර් 20 දිනැති උද්භිද උද්‍යාන භාර අරමුදලේ විශ්වාසය පළකිරීමේ ඔප්පුවේ 4(ඒ) වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිත අංක 3 හි 47(ආ) ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන තුළ පෙර වර්ෂයේ වැරදි නිවැරදි කිරීමේදී හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ ආරම්භක ශේෂයන් නැවත ප්‍රකාශ කිරීමේදී අතීතානුයෝගීව නිවැරදි කර නොතිබුණි. | උද්‍යානභාර අරමුදලේ 2020 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන තුල වත්කම්, වගකීම්, ස්කන්ධය /රඳවාගත් ඉපැයීම්වලට 2020.01.01 දිනට පැවති ආරම්භක ශේෂයන් නැවත ප්‍රකාශවන පරිදි 2020.01.01 දිනට බලපාන පරිදි ජ'නල් සටහන් මගින් නිවැරදි කිරීම් සිදුකර ඇතිබව. | ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය තුල පූර්ව වර්ෂ ගැලපීම් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයට ගැලපීම පැහැදිලිව ඉදිරිපත් කළ යුතු වීම. |
| (ආ) | ප්‍රමිත අංක 2 ප්‍රකාරව, මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කර නොතිබුණි. | 2020 වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයද වක්‍ර ක්‍රමයට පිළියෙල කර ඇති බැවින් කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම් සිදුවී ඇති ආකාරය ගලපා ඇති අතර 2019 වර්ෂයේ නාමික ලාභය පදනම් කරගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශ සකස්කර තිබුණද උද්‍යානභාර අරමුදලේ සත්‍ය මුදල් ප්‍රවාහය පිළිබද නිවැරදි අවබෝධයක් ලබාගත හැකිවන පරිදි සත්‍ය මුදල් ලැබීම් ( අග්‍රිම ලැබීම්) පදනම් කරගෙන 2020 වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශ සකස්කර ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වීම. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පසුගිය වර්ෂයේ ටිකට් පත් ආදායම රු.360,000 ක් වැඩියෙන් ගිණුම්ගත වීම සමුච්චිත අරමුදල් ගිණුමට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ටිකට්පත් ආදායම් ගිණුමට හර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | එම හර සටහන රදවාගත් ඉපැයීම් ගිණුමට සටහන්විය යුතු බැවින් ඉදිරි ගිණුම් සකස් කිරීමේදී එම දෝෂ නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාළ ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| ලැබිය යුතු ටිකට්පත් ආදායම | 194,051,390 | පැවැත්ම, නිවැරදිතාවය සහ සම්පූර්ණතාවය තහවුරු කිරීම | උද්‍යානවල ප්‍රවේශ පත්‍ර ආදායමෙන් සියයට 25 ක මුදලක් මෙම අරමුදලේ ආදායම ලෙස ලැබිය යුතු ටිකට්පත් ආදායම් ගිණුමට ගලපන අතර එයින් එක් එක් මාසයන්හි ලැබෙන ආදායම ලෙස එම මාසයේ වියදමට සමාන මුදලක් ලැබිය යුතු ටිකට් පත් ආදායමෙන් අඩුකර පොදු තැන්පත් ගිණුමට ගලපනු ලැබේ. මේ හේතුවෙන් මෙම ගිණුම් ශේෂය උපචිත වෙමින් 2020 දෙසැම්බර් 31 දිනට මෙම ශේෂය පැවතුණි. | ශේෂ තහවුරු කිරීමට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| 2018 අගෝස්තු 18 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මෙම අරමුදල වසා දැමීමට කටයුතු කළ යුතු වේ. එසේ වුවද මෙම අරමුදල වසා දැමීමට කටයුතු නොකර 2019 මාර්තු 01 | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ දී පැවති සාකච්ඡාවේදී මෙම භාර අරමුදල ව්‍යවස්ථාපිත අරමුදලක් බවට පත්කර ඉදිරියටත් පවත්වා ගැනීමට | මෙම අරමුදල ව්‍යවස්ථාපිත අරමුදලක් බවට පත් කිරීමට හෝ චක්‍රලේඛ |

| | | |
|---|---|---|
| දින රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේදී මෙම භාර අරමුදල ව්‍යාවස්ථාපිත අරමුදලක් ලෙස පිහිටුවා ඉදිරියටත් පවත්වාගෙන යාමට සාකච්ඡා කර තිබූ නමුත් 2021 ජූලි 09 දින වන විටත් එය ව්‍යවස්ථාපිත අරමුදලක් පිහිටුවීමකින් තොරව සමාලෝචිත වර්ෂය වෙනුවෙන්ද රු.64,689,090 ක වියදම් දරා තිබුණි. | කටයුතු කිරීමත්, එතෙක් අරමුදලේ කාර්යයන් ඉදිරියට පවත්වා ගැනීම සුදුසු බවටත් කරුණු සාකච්ඡා විය. නව උද්භිද උද්‍යාන පනතක් යටතේ "උද්භිද උද්‍යාන සංවර්ධන අරමුදල" නමින් ව්‍යවස්ථාපිත අරමුදලක් ඇති කිරීමට අවශ්‍ය විධි විධාන නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. | ප්‍රකාරව ඇවර කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 60,241,942 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.103,488,041 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 43,246,099 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට රටතුල පැවති කොරෝනා වසංගතය හේතුවෙන් ටිකට්පත් ආදායම හා වෙනත් ආදායම රු. 125,676,371 කින් අඩුවීම හා වියදම රු. 82,430,271 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උද්භිද උද්‍යාන භාර අරමුදලක් පිහිටුවීමේ මූලික අරමුණ වී තිබුණේ උද්භිද උද්‍යානවල කටයුතු මනා ලෙස හා ක්‍රමවත්ව පවත්වාගෙන යාම සඳහා සහායක ක්‍රියාකාරකම් වෙනුවෙන් මූල්‍යකරණය කිරීමයි. නමුත් අරමුදලේ වියදම් දැරීම සම්බන්ධයෙන් පරීක්ෂාවේ දී එම අරමුණට අනුකූල නොවන ලෙස සේවක නිල ඇඳුම් හා මුද්‍රණ වියදම් සඳහා රු.6,534,371 ක වියදම් දරා තිබුණි. | කම්කරු සේවකයින්ට හිමි නිල ඇඳුම් දීමනාව වන රු.4,000 වෙනුවට මසා නිමකල ඇඳුම් ලබාදීමක් බවත්, එයින් රජයට අමතර වැය බරක් සිදුවී නොමැති බවත් , ඉතිරියක් සිදුවී ඇති බවත් දන්වා සිටිමි. මුද්‍රණ වියදම් වලින් උද්‍යානවලට ඇතුළු වීම සඳහා ප්‍රවේශ පත්‍ර මුද්‍රණය කිරීම සඳහා ගෙවූ සුවිශේෂී පුනරාවර්තන ගෙවීම් වේ. | අරමුදල පිහිටුවීමේ අරමුණු වලට අනුකූලව වියදම් දැරීමට කටයුතු කළ යුතු වීම. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉටු කිරීමට අපේක්ෂා කරන ලද ක්‍රියාකාරකම් 12 කට අදාළව ඇස්තමේන්තුගත වියදම රු.49,640,000 ක් වුවද, තත්‍ය වියදම රු.33,983,583 වීමෙන් ඉතිරිය රු.15,656,417 ක් විය. එම ඉතිරිය ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 100 ක් අතර පරාසයක පැවතුණි. | මාස කිහිපයක් උද්භිද උද්‍යාන ඇතුළු කාර්යාල වසා දැමීම නිසා ඉදිකිරීම් හා සම්බන්ධ කාර්යයන් ආරම්භ කිරීමේ ප්‍රමාදයක් පැවතීමත්, මිලදී ගැනීම් ඇතුළු වියදම් හැකිතාක් සීමා කිරීමත්, අපේක්ෂිත මට්ටමින් ශාක ගවේශන කටයුතු ඉටුකිරීමට නොහැකි වීමත් මෙම ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු විය. තවද 2020 වර්ෂයට අදාලව ඉල්ලාසිටි පරිදි අග්‍රිම මුදල් නොලැබීම නිසා රු. 4,732,280 ක මුදලක් අතැති බිල්පත් ලෙස ඉතිරිවීමක්ද සිදුවී ඇත. | ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යයන් නියමිත කාලය තුල ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී මුළු ඇස්තමේන්තුවෙන් රු. 10,300,000 ක් එනම් සියයට 13 ක් නිශ්චිත කාර්යයන් සඳහන් නොකරමින් පුනරාවර්තන වියදම්, අසම්භාව්‍ය හා පොදු කාර්ය වියදම් ලෙස ප්‍රතිපාදන වෙන් කර තිබුණි. | පොදු කාර්යයන් සඳහා වෙන්කරනු ලබන ප්‍රතිපාදන සම්බන්ධව උද්‍යානභාර අරමුදලේ භාරකාර මණ්ඩලය දැනුවත් කිරීමක් සිදුකරන අතර, උද්‍යානභාර අරමුදලේ විශ්වාසය පලකිරීමේ ඔප්පුවේ සඳහන් අරමුණු C , E ,F අනුව සහ එකී ලියවිල්ලේ 5(ආ) පරිදි අරමුදලේ කාර්යසාධනය වැඩිදියුණු කිරීමට අවශ්‍ය මෙම වියදම් සඳහා භාරකාර මණ්ඩල රැස්වීම් වලදී අනුමැතිය ලබාගෙන ඇත. | පුනරාවර්තන වියදම් සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමෙදී වඩාත් සැලකිලිමත්ව සිදු කළ යුතුය. |